# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,486 — 1965 අගෝස්තු 20 වැනි සිකුරාද — 1965.8.20

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස — ඉඩම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට |
|---|---|
| **ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම :—** | |
| ප්‍රාරම්භක දැන්වීම ... ... ... | — |
| අවසාන නියෝග ... ... ... | — |
| **ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් ඉඩම් විකිණීම :—** | |
| බස්නාහිර පළාත ... ... ... | — |
| මධ්‍යම පළාත ... ... ... | — |
| දකුණු පළාත ... ... ... | — |
| උතුරු පළාත ... ... ... | — |
| නැගෙනහිර පළාත ... ... ... | — |
| වයඹ පළාත ... ... ... | — |
| උතුරු මැද පළාත ... ... ... | — |
| ඌව පළාත ... ... ... | — |
| සබරගමු පළාත ... ... ... | — |
| **ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම :—** | |
| බස්නාහිර පළාත ... ... ... | — |
| මධ්‍යම පළාත ... ... ... | — |
| දකුණු පළාත ... ... ... | — |
| උතුරු පළාත ... ... ... | — |
| නැගෙනහිර පළාත ... ... ... | — |
| වයඹ පළාත ... ... ... | — |
| උතුරු මැද පළාත ... ... ... | — |
| ඌව පළාත ... ... ... | — |
| සබරගමු පළාත ... ... ... | — |
| **ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් ... ...** | 445 |
| **ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් ... ...** | 453 |
| **ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් ... ...** | — |
| **ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් ... ... ...** | 454 |
| **ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම ...** | — |


## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම්, වාරිමාර්ග හා විදුබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

කොළඹ දිස්ත්‍රික්කයේ දකුණු අළුත්කුරු කෝරළේ වත්තල-මාබෝලේ පළාත් ආණ්ඩු සභා ප්‍රදේශය තුළ මීගමු පාරේ පිහිටි වරිපනම් අංක 367 දරණ ප්‍රමාණයෙන් පාර්චස් 15 පමණ වූ දිවුල් ගහවත්ත නමැති ඉඩම් කැබැල්ල :—

උතුරට සහ බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කැබැල්ල; නැගෙනහිරට : කොළඹ-මීගමු ප්‍රසිද්ධ පාර; දකුණට : එම ඉඩමේ ඉතිරි කැබැල්ල සහ රජය සතු ඉඩම.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංකය : ජේ. 63-64 එල් ජී. 1200—කිව්ජ් 831.
1965 ජූලි මස 2 දින, කොළඹ දී ය.

8–563—65.8.20 දින අංක 14,486 දරණ ගැසට් පත්‍රය.

## විශේෂ නිවේදනයයි

1965 අගෝස්තු 11 වැනි බදාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1965 අගෝස්තු 13 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කිරීම සඳහා එවන සියලුම දැන්වීම් සහ නිවේදන, 1965 අගෝස්තු 7 වැනි බදාදා දහවල් 12 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1965 අගෝස්තු 3 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

යොමු අංකය : ජේ. 63/64 ඊ. 1057 / ඉ.අ/3/122

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 38 වෙනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

### 1965 අංක 224 දරණ ආඥාව

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත් එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දැක්වෙන නියමිත ඉඩම, ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

කොළඹ, 1965 ජූලි මස 21 දින.

### උපලේඛනය

**I**

**ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා**

කළුතර දිස්ත්‍රික්කයේ උප දිසාපති.

**II**

**ඉඩමේ විස්තරය**

කළුතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර පස්දුන් කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොටසේ බදුරලිය ග්‍රාම සේවක කොටසේ කඹුරාවල ගමේ පිහිටි ප්‍රමාණයෙන් අ. 3ක් පමණ වූ කුරුඳුගස් මානාන සහ අටහවුල් හේනේ නැමති ඉඩම් කොටස් දෙකට මායිම්:—

**1. කුරුඳුගස් මානාන—ප්‍රමාණය : අ. 1, රූ. 3 පමණ**

උතුරට : කනත්තෙ වත්ත ; නැගෙනහිරට පාසැල් පිහිටා ඇති ඉඩම සහ අටහවුල් හේන ; දකුණට : තිරිමානාකැටිය-අගලවත්ත පාර සහ පාසැල් භූමිය ; බටහිරට : කුරුඳුගස් මානාන සහ කනත්තෙ වත්තෙන් කොටසක්.

**2. අටහවුල් හේනෙන් කොටසක්—ප්‍රමාණය : අ. 1, රූ. 1ක් පමණ**

උතුරට : අටහවුල්හේනෙන් කොටසක් සහ කනත්තෙවත්තෙන් කොටසක්; නැගෙනහිරට : අඩි පාර ; දකුණට : පාසැල් පිහිටා ඇති ඉඩම ; තිරිමානාකැටිය-අගලවත්ත පාර සහ ගෙයක් සහ වැසිකිළියක් පිහිටි මෙම ඉඩමේ කොටසක් ; බස්නාහිරට : කුරුඳුගස් මානෙන් කොටසක්, පාසැල් පිහිටා ඇති ඉඩම සහ කනත්තෙවත්තෙන් කොටසක්.

8–529—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

යොමු අංකය : ජේ. 61/62 ඇල් 656 / 3/3/40.

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 38 වෙනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

### 1965 අංක 225 දරණ ආඥාව

1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත් එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ 2 වෙනි තීරයේ අනුරූප සටහනේ දැක්වෙන නියමිත ඉඩම් ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

කොළඹ, 1965 මැයි මස 5 වැනි දින.

### උපලේඛනය

**I**

**ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා**

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දිසාපති.

**II**

**ඉඩමේ විස්තරය**

1. පහත් සඳහන් අන්දමට මායිම් වී ඇති, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදපත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ තෝපා වැව බැදිවැව ගමේ පිහිටි බැදි වැව කුඹුර (අංක 2,60,744 දරණ සැලැස්මේ අංක 3,242 10,383 දරණ කැබැල්ල) යනුවෙන් විස්තර කර ඇති ප්‍රමාණයෙන් අක්කර 3, රූඩ් 3, පර්චස් 00 ක් පමණ වන ඉඩම :—

උතුරට : වැව්කන්ඩියේ රක්ෂිත බිම ; දකුණට : රජයේ ඉඩම ; නැගෙනහිරට : අංක 10,284 දරණ ප්ලෑනයේ අංක 3,242 දරණ බිම් කැබැල්ල ; බස්නාහිරට : රජයේ ඉඩම.

2. පහත සඳහන් අන්දමට මායිම් වී ඇති පොළොන්නරු දිස්ත්‍රික්කයේ මැදපත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ බැදිවැව ගමේ පිහිටි බැදිවැවකැලේ (අංක 2,60,418 දරණ සැලැස්මේ අංක 3,242/10,284 දරණ කැබැල්ල) යනුවෙන් විස්තර කර ඇති ප්‍රමාණයෙන් අක්කර 0, රූඩ් 2, පර්චස් 07 පමණ වන ඉඩම :—

උතුරට : වැව්කණ්ඩියේ රක්ෂිත බිම ; දකුණට : රජයේ ඉඩම් ; නැගෙනහිරට : වැව්කන්ඩියේ රක්ෂිත බිම ; බස්නාහිරට : අංක 10,283 දරණ ප්ලෑනයේ අංක 3,242 දරණ බිම් කැබැල්ල.

8–541—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධන) පනතින් සංශොධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 38 (අ) වැනි වගන්තිය යටතේ ආඥාව

1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) වෙනි වගන්තියෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබලය පිළිබඳ ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම්, පහත සඳහන් උපලේඛනයේ 6 වැනි තීරයේ සඳහන් ඉඩම් අත්කරගන්නා නිලධාරී හෝ ඔහු විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට එම උපලේඛනයේ 4 වෙනි තීරයේ අනුරූප සටහනේ දක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියෝග කරමි.

1965 ජූලි මස 27 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

## උපලේඛනය

| 1 වැනි තීරය<br>යොමු අංකය | 2 වැනි තීරය<br>1965<br>ආඥා අංකය | 3 වැනි තීරය<br>ඉඩම් අත්කර ගන්නා නිලධාරි | 4 වැනි තීරය<br>ඉඩමේ විස්තරය |
|---|---|---|---|
| ජේ. 57/58 ඊ. 711—ඉ. අ/15 | 228 | දිසාපති, අම්පාර දිස්ත්‍රික්කය | අංක ඒ. 1369 මූලික සැලැස්මේ අංක 1, 2 3, 4 හා 5 දරණ බිම් කැබලි |
| ජේ. 62/63 එල්ජී 462—එම්ජ්/ඒසී/8621/61 | 229 | නාගරික කොමසාරිස්, කොළඹ | අංක ඒ. 5357 මූලික සැලැස්මේ අංක 1 දරණ බිම් කැබැල්ල |
| ජේ./එල්.එල්. ඩී/2543—2/42/5503 | 230 | උප දිසාපති, කෑගල්ල දිස්ත්‍රික්කය | අංක ඒ. 777 දරණ මූලික සැලැස්මේ අංක 2 හා 4 දරණ බිම් කැබලි |
| ජේ/එල්.එල්.ඩී/648/53—කිව.බී. 113 | 231 | අතිරේක උප දිසාපති, කොළඹ දිස්ත්‍රික්කය | අංක ඒ. 3901 මූලික සැලැස්මේ අංක 11 හා 15 දරණ බිම් කැබලි |
| ජේ. 57 ටී. 421—ඉ.අ/2/8 | 232 | උප දිසාපති, කළුතර දිස්ත්‍රික්කය | අංක ඒ. 4313 මූලික සැලැස්මේ අංක 1 දරණ බිම් කැබැල්ල |
| ජේ/ටී.ඩබ්/1385—එල්එච්/බී 49 | 233 | උප දිසාපති, කළුතර දිස්ත්‍රික්කය | අංක ඒ. 3228 මූලික සැලැස්මේ අංක 1 දරණ බිම් කැබැල්ල |

8-568—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (I) උප වගන්තිය යටතේ, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

1. කොළඹ දිස්ත්‍රික්කයේ, නැගෙනහිර සියනෑ කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, පස්යාල ගමේ පිහිටි ඉහලවෙල නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් පර්චස් 11.5 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි කොටස :—

උතුරට : ආර්. ඒ. ප්‍රේමරත්න හිමිකම් කියන මෙම ඉඩමේ කොටසක් (අත්කර ගැනීමට යන) ;

නැගෙනහිරට : කොළඹ-නුවර ප්‍රසිද්ධ පාර ;

දකුණට : තෙමානිස් හිමිකම් කියන බණ්ඩාරවත්ත නමැති ඉඩම ;
බටහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස.

2. කොළඹ දිස්ත්‍රික්කයේ, නැගෙනහිර සියනෑ කෝරලේ ප්‍රාදේශීය ආදායම නිලධාරි කොට්ඨාශයේ, පස්යාල ගමේ පිහිටි ඉහලවෙල නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් පර්චස් 3.25 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි කොටස :—

උතුරට : ජේ. ඇම්. පී. දිසානායක හිමිකම් කියන මෙම ඉඩමේ කොටසක් (අත්කර ගැනීමට යන) ;

නැගෙනහිරට : කොළඹ-නුවර ප්‍රසිද්ධ පාර ;

දකුණට : පී. ඇස්. සුබසිංහ හිමිකම් කියන මෙම ඉඩමේ කොටසක් (අත්කර ගැනීමට යන) ;

බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස.

3. කොළඹ දිස්ත්‍රික්කයේ, නැගෙනහිර සියනෑ කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, පස්යාල ගමේ පිහිටි ඉහලවෙල නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් පර්චස් 14.75 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි කොටස :—

උතුරට : ඇම්. පී. ඒ. සමරසේන හිමිකම් කියන මෙම ඉඩමේ කොටසක් (අත්කර ගැනීමට යන) ;

නැගෙනහිරට : කොළඹ-නුවර ප්‍රසිද්ධ පාර ;

දකුණට : ආර්. ඒ. ප්‍රේමරත්න හිමිකම් කියන මෙම ඉඩමේ කොටසක් (අත්කර ගැනීමට යන) ;

බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස.

4. කොළඹ දිස්ත්‍රික්කයේ, නැගෙනහිර සියනෑ කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, පස්යාල ගමේ පිහිටි ඉහලවෙල නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් පර්චස් 1.25 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි කොටස :—

උතුරට : ඩබ්ලිව්. විජේබාහු විජේසිංහ හිමිකම් කියන මෙම ඉඩමේ කොටසක් (අත්කර ගැනීමට යන) ;

නැගෙනහිරට : කොළඹ-නුවර ප්‍රසිද්ධ පාර ;

දකුණට : ජේ. ඇම්. පී. දිසානායක හිමිකම් කියන මෙම ඉඩමේ කොටස (අත්කර ගැනීමට යන) ;

බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස.

5. කොළඹ දිස්ත්‍රික්කයේ, නැගෙනහිර සියනෑ කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, පස්යාල ගමේ පිහිටි ඉහලවෙල නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් පර්චස් 6.75 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි කොටස :—

උතුරට සහ බටහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස් ;

නැගෙනහිරට : කොළඹ-නුවර ප්‍රසිද්ධ පාර ;

දකුණට : ඇම්. පී. ඒ. සමරසේන හිමිකම් කියන මෙම ඉඩමේ කොටසක් (අත්කර ගැනීමට යන).

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංකය : ජේ. 64/65 පී 176—කිව් සී 329/කේ.

1965 ජූලි මස 29 වැනි දා,
කොළඹ දී ය.

8-610—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය.

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වෙනි පරිච්ඡේදය)

### වැරදි නිදොස් කිරීම

යොමු අංකය : ජේ. 63/64 ඊ 420 / 2/11/235/64

නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ මාවෙල ග්‍රාමසේවක වසමේ මැදකුඹුර නැමැති ඉඩමෙන් අක්කර 1, රූඩ් 2ක් පමණැති බිම් කොටස සම්බන්ධයෙන් ඉඩම් අත්කර ගැනීමේ පණතේ (460 වෙනි පරිච්ඡේදය) පස්වන වගන්තිය යටතේ අංක 14,216 සහ 64.11.6 වැනි දින ගැසට් පත්‍රයේ 64.8.24 දින දරණ මගේ ප්‍රකාශයේ ඉඩමේ මායිම් පහත සඳහන් ලෙස කියවිය යුතු බව සියලු දෙනාගේ ම දැනගැනීම සඳහා මෙයින් දැනුම් දෙමි :—

උතුරට : මාස්වෙල සිට පුස්සැල්ලාව දක්වා යන බී. ආර්. සී. අඩි පාර සහ අඹගහ කුඹුර (කොටසක්) ; නැගෙනහිරට : අඹගහ කුඹුර (කොටසක්) ; දකුණට : මහබලහපුව නැමැති කුඹුරු ඉඩම ; බස්නාහිරට : හීන්බලහපුව නැමති කුඹුරු ඉඩම.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

8-567—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

**5 වන වගන්තිය යටතේ ප්‍රකාශය**

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම් පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර පස්දුන් කෝරලයේ ගඟබඩ පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොටසේ අංක 819 ඒ. දකුණු මහගම ගමේ පිහිටි දකුණු මහගම ග්‍රාම සේවක කොටසේ පිහිටි දොඩන්ගහවත්ත හා දොඩන්ගහවත්ත උඩ කට්ටිය නමැති ඉඩම් වලින් ඉඩම් කොටස් දෙකක් මායිම් පහත දැක්වේ:—

**අ.ග.සි. 134 අංක 417 දරණ බිම් කට්ටියෙන් කොටසක්—ප්‍රමාණය' පර්චස් 16—දොඩන්ගහවත්ත**

උතුරට: මෙම ඉඩමේම කොටසක් ද;

නැගෙනහිරට: දොඩම්ගහවත්තද, අ.ග.සි. 134 බිම්කට්ටි අංක 418;

දකුණට: මෙම ඉඩමේම කොටසක් ද;

බස්නාහිරට: අ.ග.සි. අංක 403 දරණ ඉඩම් කැබැල්ලද වේ (රජයේ).

**2. අ.ග.සි. 134 අංක 418 දරණ බිම්කට්ටියෙන් කොටසක්—ප්‍රමාණය: පර්චස් 24ක් පමණ—දොඩන්ගහවත්ත උඩ කට්ටිය**

උතුරට: මෙම ඉඩමේම කොටසක් ද;

නැගෙනහිරට: අගලවත්තේ සිට අතුර දක්වා ඇති ප්‍රසිද්ධ පාරද;

දකුණට: මෙම ඉඩමේම කොටසක් ද;

බස්නාහිරට: අ.ග.සි. 134 අංක 417 දරණ බිම්කැබැල්ලෙන් කොටසක්.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක: ජේ. 63/64 එල්. 1119 (වීර්)—ඉඅ/3/129.
1965 ජූලි මස 27 දින,
කොළඹ දීය.

8–531—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

**5 වන වගන්තිය යටතේ ප්‍රකාශය**

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරලයේ, මිල්ලැව ග්‍රාම සේවක කොටසේ, මිල්ලැව ගමෙහි පිහිටි ප්‍රමාණයෙන් පර්චස් 72 ක් පමණවූ කරදමන්ඩියහේන—කැබෙලි අංක 1 වද, ප්‍රමාණයෙන් පර්චස් 08 ක් පමණවූ කැබෙලි අංක 2ට ද මායිම්:—

**කැබෙලි අංක: 1.**

උතුරට: හොරණ-පාදුක්ක ප්‍රසිද්ධ පාර සහ පාඨශාලා ඉඩම;

නැගෙනහිරට: පාඨශාලා වත්ත සහ ගොරොක්ගහකුඹුර;

දකුණට: ගොරොක්ගහකුඹුර;

බස්නාහිරට: ඩී. ඇස්. තිලකරත්න අයිතිකම් කියන ඉඩම සහ ගොරොක්ගහකුඹුර.

**කැබෙලි අංක: 2.**

උතුරට: ඒ. සී. චන්ද්‍රසේකර අයිතිකම් කියන ඉඩම;

නැගෙනහිරට: ගොරොක්ගහකුඹුර සහ ඒ. සී. චන්ද්‍රසේකර අයිතිකම් කියන ඉඩම;

දකුණට: ගොරොක්ගහකුඹුර සහ පාඨශාලා වත්ත;

බටහිරට: පාඨශාලා වත්ත.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක ජේ 63/64 ඊ 904.
1965 ජූලි මස 29 දින,
කොළඹ දී ය.

8–662—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

**5 වන වගන්තිය යටතේ ප්‍රකාශය**

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධනය) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම්, වාරිමාර්ග හා විදුබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත්පත්තුවේ පන්නල ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කන්දපොල පළාතේ, ගල්ලැහැමුල්ල ගමේ දෙල්ගහවත්ත නැමැති ඉඩමේ පහත සඳහන් මායිම් තුළ පිහිටි අ. 3, රූ. 0, ප. 00ක් පමණ විශාල බිම් ප්‍රමාණය:—

උතුරට: යෝජිත ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට: ජේ. එච්. බබාසිංඤෝට අයිතිකම් කියන දෙල්ගහවත්ත සහ කු/ගල්ලැහැමුල්ල පාසැල් ඉඩම; දකුණට: උතුරාවෙල-තුත්තිරිපිටිය ගම්සභා පාර; බස්නාහිරට: යෝජිත ඉඩමේ ඉතිරි කොටස.

සී. පී. ද. සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංකය: ජේ. 63/64 ඊ 1113.
1965 ජූලි 29 දින,
කොළඹ දී ය.

8–565—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## 1964රේ අංක 28 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥාපණතින් සංශොධිත වූ ඉඩම් ලබාගැනීමේ ආඥාපණත (460 පරිච්ඡේදය)

**7 වැනි වගන්තිය යටතේ වූ දන්වීමයි**

අංකය: ඉඅ. 4/4.

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964රේ අංක 28 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥාපණතින් සංශෝධිත වූ 1950යේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:—

මහගම්මැද්ද ගමේ, කළුතර තොටමුනේ, කළුතර දිස්ත්‍රික්කයේ, බස්නාහිර පලාතේ—සැලැස්ම අංක ඒ. 4,581—කැබලි 1-13.

**කැබලි අංක: 1.**

ඉඩමේ නම: පට්ටියවත්ත; විස්තරය: අවු. 35 වයස ඇති පොල් ගස් 1 සහ අවු. 15 වයස් ඇති පොල්ගස් 2 ඇතුලත් ඉඩම; අයිතිකරුවන්ගේ නම: ඇලන් සේනසිංහ මීය., මහගම්මැද්ද, පයාගල; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 01.8.

**කැබලි අංක: 2.**

ඉඩමේ නම: පට්ටියවත්ත; විස්තරය: අවු. 35 වයස් ඇති පොල් ගස් 14, අවු. 15 වයස ඇති පොල් ගස් 1, අවු. 35 වයස් ඇති අඹ ගස් 1, අවු. 35 වයස ඇති දෙල්ගස් 1 සහ අවු. 15 වයස ඇති පුවක්

ගස් 17 ඇතුලත් ඉඩම; අයිතිකරුවන්ගේ නම: ඇලන් සේනසිංහ මිය., මහගම්මැද්ද, පයාගල; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 28.9.

**කැබලි අංක: 3.**

ඉඩමේ නම: මහගෙදර වත්ත; විස්තරය: අවු. 5 වයස ඇති පුවක් ගස් 3 ඇතුලත් ඕවිට; අයිතිකරුවන්ගේ නම: ඩී. එච්. පුංචිහෙට්ටි, මහගම්මැද්ද, පයාගල: ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 06.3.

**කැබලි අංක: 4.**

ඉඩමේ නම: මහගෙදර වත්ත; විස්තරය: ඕවිට; අයිතිකරුවන්ගේ නම: එච්. ඩී. ඩේවිඩ්, මහගම්මැද්ද, පයාගල; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 03.3.

**කැබලි අංක: 5.**

ඉඩමේ නම: මහගෙදර වත්ත; විස්තරය: මැටියෙන් නිමකරන ලද තාවකාලික ලිඳ ඇතුලත් ඕවිට; අයිතිකරුගේ නම්: ආර්. එෆ්. වීරකෝන් සහ ඩී. ඇම්. පුංචිහෙට්ටි, මහගම්බැද්ද, පයාගල; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 04.0.

**කැබලි අංක: 6.**

ඉඩමේ නම: පට්ටිය වත්ත; විස්තරය: අවු. 35 වයස ඇති පොල් ගස් 85, අවු. 15 වයස ඇති පොල් ගස් 2, අවු. 10 වයස ඇති පොල් ගස් 15, අවු. 5 වයස ඇති පොල් පැල 1, අවු. 20 වයස ඇති අඹගස් 1, අවු. 15 වයස ඇති රඹුටන් ගස් 1, අවු. 20 වයස ඇති කොස්ගස් 1, අවු. 25 වයස ඇති අඩි 3 වටප්‍රමාණය ඇති හල්මිල්ල ගස් 1 ඇතුලත් ඉඩම; අයිතිකරුගේ නම: ඩබ්. එෆ්. වික්‍රමසිංහ, මහගම්මැද්ද, පයාගල; ප්‍රමාණය: අ. 0, රූ. 3, ප. 28.9.

**කැබලි අංක: 7.**

ඉඩමේ නම: පට්ටිය වත්ත; විස්තරය: වගාවක් නොමැති ඉඩම් කොටස; අයිතිකරුගේ නම: ඩබ්. එෆ්. වික්‍රමසිංහ, මහගම්මැද්ද, පයාගල; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 00.2.

**කැබලි අංක: 8.**

ඉඩමේ නම: කොස්පානවත්ත; විස්තරය: අවු. 35 වයස ඇති පොල්ගස් 13, අවු. 3 වයස ඇති පොල්පැල 1, අවු. 10 වයස ඇති අඹගස් 1 සහ සිමෙන්ති බදාමෙන් නිම කරන ලද අත්තිවාරමක් ඇතුලත් ඉඩම; අයිතිකරුවන්ගේ නම්: ඩබ්. ඇෆ්. වික්‍රමසිංහ, මහගම්මැද්ද, පයාගල, ඇස්. ආර්. ගුණවර්ධන මිය., 15/3, ගෝවර් වීදිය, කොළඹ සහ ඩී. රූපසේන, මහගම්මැද්ද, පයාගල; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 28.4.

**කැබලි අංක: 9.**

ඉඩමේ නම: කොස්පානවත්ත; විස්තරය: අවු. 25 වයස ඇති පොල්ගස් 1 ඇතුලත් ඉඩම; අයිතිකරුවන්ගේ නම්: ඩබ්. ඇෆ්. වික්‍රමසිංහ, මහගම්මැද්ද, පයාගල, ඇස්. ආර්. ගුණවර්ධන මිය., 15/3, ගෝවර් වීදිය, කොළඹ සහ ඩී. රූපසේන, මහගම්මැද්ද, පයාගල; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 06.1.

**කැබලි අංක: 10.**

ඉඩමේ නම: වේගවත්ත; විස්තරය: වගාවක් නොමැති බිම්තීරුව; අයිතිකරුවන්ගේ නම්: එස්. ආර්. ගුණවර්ධන මිය., ජී. ආර්. ගුණවර්ධන සහ රන්ජිත් ගුණවර්ධන, 15/3, ගෝවර් වීදිය, කොළඹ; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 01.7.

**කැබලි අංක: 11.**

ඉඩමේ නම: වේගවත්ත; විස්තරය: අවු. 35 වයස ඇති පොල් ගස් 7, අවු. 3 වයස ඇති පොල්පැල 3, අවු. 15 වයස ඇති කොස් ගස් 2 සහ අවු. 35 වයස ඇති දෙල්ගස් 1 ඇතුලත් ඉඩම; අයිතිකරුවන්ගේ නම්: එස්. ආර්. ගුණවර්ධන මිය., ජී. ආර්. ගුණවර්ධන සහ රන්ජිත් ගුණවර්ධන, 15/3, ගෝවර් වීදිය, කොළඹ; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 28.6.

**කැබලි අංක: 12.**

ඉඩමේ නම: වේගවත්ත; විස්තරය: පලදාවක් නොමැති ඉඩම්තීරුව; අයිතිකරුවන්ගේ නම්: ඩී. එච්. සමරනායක මිය., ඩී. ඒ. විජයවික්‍රම මිය., දළුවත්ත, පයාගල, ඩී. ඒ. සෙනෙවිරත්න, තැපැල් ස්ථානාධිපති, පයාගල; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 01.1.

**කැබලි අංක: 13.**

ඉඩමේ නම: වේගවත්ත; විස්තරය: අවු. 35 වයස ඇති පොල් ගස් 9, අවු. 25 වයස ඇති පොල්ගස් 2, අවු. 35ක් වයස ඇති දෙල්ගස් 2, අවු. 10ක් වයස ඇති දොඹගස් 1 සහ අවු. 15 වයස ඇති පුවක් ගස් 1 ඇති පොල් ඉඩම; අයිතිකරුවන්ගේ නම්: ඩී. එච්. සමරනායක මිය., ඩී. ඒ. විජයවික්‍රම මිය., දළුවත්ත, පයාගල, ඩී. ඒ. සෙනෙවිරත්න, තැපැල් ස්ථානාධිපති, පයාගල; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 28.4.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 65.10.6 වැනි දින පූ. භා. 10.30 ට කලුතර කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1965.9.28 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. තමන්ගේ අයිතිය තහවුරු කිරීමට ඔප්පු සහ අනිකුත් ලිපි මා වෙත මෙදින ඉදිරිපත් කළයුතු වේ.

බී. සී. චන්ද්‍රදාස,
ආණ්ඩුවේ උප ඒජන්තතැන.

1965 අගෝස්තු මස 7 වැනි දින,
කළුතර කච්චේරිය.

8–547—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

සඳහන් අංකය: ඇල්ඩී/බීඩී. 127

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (I) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:—

මහනුවර දිස්ත්‍රික්කයේ, අඹගමුව කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, අඹගමුව කෝරළේ, හැටන්-දික්ඔය පලාත් ආණ්ඩු සභා සීමාව තුල, අංක '7 දරන දරවැල්ල කොට්ඨාශයේ, දික්ඔය (කොටසක්) ගමේ පිහිටි, මූලික සැලසුම් අංක මහ 30 හා කැබෙලි අංක 1 වශයෙන් මැන විස්තර කර ඇති, දැනට සීමාසහිත ඇන්ග්ලෝ සිලෝන් ඇන්ඩ් ජෙනරල් එස්ටේට් සමාගම, නියෝජිතවරු: සීමාසහිත බොයිස් බ්‍රදර්ස් සහ සමාගම, 59, රජවීදිය, කොළඹ. අයිතිකම් කියනු ලබන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, ප. 07.20 දරවැල්ල පාරේ වරිපනම් අංක 52-58 (කොටසක් වූ) දරවැල්ල එස්ටේට් නමැති ඉඩම.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 1965.10.15 වැනි දින පූ. භා. 9.30ට මහනුවර දිසාපති කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1965.10.7 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. තවද එම ඉඩම ගැන ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කර ගැනීම පිණිස සහ එම ඉඩම ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධව පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත් කළ යුතුයි.

ඇස්. මාරලන්ද,
ආණ්ඩුවේ උප දිසාපති,
මහනුවර දිස්ත්‍රික්කය.

1965 අගෝස්තු 5 වැනි දින,
මහනුවර කච්චේරිය.

8–618—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

අංකය : කිවිඞී. 153.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

මූලිකසැලැස්මේ අංකය : කො. 48 ; ගම : පත්තලගෙදර (කොටසක්).

**කැබලි අංකය : 1.**

ඉඩමේ නම : ෆාට්ග්‍රෝව් වත්ත නොහොත් බොල්වත්ත ; විස්තර : අවු. 30-50 වූ පොල් ගස් 68 ක් ඇති ඉඩම ; අයිතිකම් කියන අය : කේ. ඒ. අර්නෝලිස් අප්පුහාමි, පත්තලගෙදර, වේයන්ගොඩ ; ප්‍රමාණය : අ. 1, රූ. 0, ප. 04.7.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1965.10.6 වැනි දින පූ. භා. 9.30 ට කොළඹ කච්චේරියේදී අයිතිවාසිකම් ඔප්පුකිරීම සඳහා ඇති ලියකියවිලිද රැගෙන මා සම්මුඛවිය යුතුයි.

තවද, 1965 ක් වූ සැප්තැම්බර් මස 29 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඒ. ඊ. පණ්ඩිතරත්න,
ආණ්ඩුවේ උප දිසාපති,
කොළඹ දිස්ත්‍රික්කය.

1965 අගෝස්තු 14 වැනි දින,
කොළඹ කච්චේරිය.

8–640—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කරගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය : කිවි.බී. 614.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මූලික සිතියම් අංක කො. 52—කොළඹ දිස්ත්‍රික්කයේ, හාපිටිගම් කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොටසේ, උඩුගහ පත්තුවේ පිහිටි බටලීය නමැති ගම.

**කැබලි අංක : 1.**

ඉඩමේ නම : මාරගහවත්ත ; විස්තර : අවු. 5-25 දක්වා වයසැති පොල්ගස් 107 කින්ද, අවු. 12ක් වයසැති කොස්ගසකින්ද, අවු. 12ක් වයසැති පුවක් ගස් 20 කින්ද යුත් පොල් ඉඩමක් ; හිමිකම් කියන්නාගේ නම : බටලීයේ පදිංචි ජී. ඇම්. එච්. ඩබ්ලිව්. පෙරේරා මහතා ; ප්‍රමාණය : අ. 1, රූ. 0, ප. 17.5.

**එකතුව : අ. 1, රූ. 0, ප. 17.5.**

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1965.9.24 වැනි දින පූ. භා. 9.30 ට කොළඹ කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1965 සැප්තැම්බර් මස 15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. ඉඩම්වලට තම තමන්ගේ ඇති අයිතිය සම්බන්ධයෙන් ඇති ඔප්පු තිරප්පු හා වෙනත් ලියකියවිලිද මෙම විභාගයේදී මා වෙත ඉදිරිපත් කළ යුතුයි.

අ. පු. බ. මනම්පේරි,
අතිරේක උප දිසාපති.
කොළඹ දිස්ත්‍රික්කය.

1965 අගෝස්තු මස 5 වැනි දින,
කොළඹ කච්චේරිය.

8–442—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය : ආර්/කිවි. 446.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මූලික සැලැස්මේ අංකය කො. 67.

පිහිටීම : කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, කොළඹ නාගරිකයේ පිහිටි අංක 39 දරණ මිලාගිරිය කොට්ඨාශයේ බම්බලපිටිය.

**කැබලි අංකය : 1.**

ඉඩමේ නම : පුරාණ කදිරේසන් හින්දු කෝවිල, බම්බලපිටිය ගාලු පාරේ වරිපනම් අංක 123 ; ඉඩමේ විස්තර : අවුරුදු 1-40 දක්වා වයසැති පොල්ගස් 43ක්ද, අවු. 10ක් වයසැති කොස් ගසක්ද, අවු. 5-15 දක්වා වයසැති පුවක්ගස් 11ක්ද, අවු. 2-10 වයසැති කොහොඹ ගස් 2ද, අවු. 30ක් වයසැති බෝ ගසක්ද, අවු. 5-10 අතර සපුගස් 7 ද, අවු. 5-10 වයසැති ජම්නාරන් ගස් 2ක් සහ කපරාරු කරන ලද තාප්පයක කොටසක් සහිත වත්ත ; අයිතිකරුවන්ගේ නම් : පුරාණ කදිරේසන් කෝවිලේ භාරකරු ආර්. ඇම්. ඒ. ආර්. ඒආර්. වීආර්. වීරප්පා චෙට්ටියාර්, 245, සමුද්‍ර මාවත, කොළඹ 11 ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 00.50.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1965.10.8 වැනි දින පූ. භා. 9.30 ට කොළඹ කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1965.9.30 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

එච්. ඇම්. ඉසෑඩ් ෆාරුක්
ආණ්ඩුවේ අතිරේක දිසාපති,
කොළඹ දිස්ත්‍රික්කය.

1965 අගෝස්තු 7 වැනි දින,
කොළඹ කච්චේරිය.

8–441—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

## ඉඩම් ලබාගැනීමේ ආඥාපනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

අංකය : ඉඅ/2/15.

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම භුක්ති විශෙෂය ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 7 වැනි වගන්තියේ (I) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ භුක්ති විශෙෂයේ විස්තර :—

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළයේ, උඩුගහ පත්තුවේ, අරකාවිල ගමේ පිහිටි, මූ. සැ. නො. ක. 6 කැබලි අංක 1.

**කැබලි අංකය : 1.**

ඉඩමේ නම : හික්ගහහේන ; විස්තර : අවුරුදු 6-10 පමණ වූ රබර් ගස් 132, අවුරුදු 4-10 පමණ වූ රබර් ගස් 4 කින් හා හදගෙන යන ගොඩනැගිල්ලකින් යුත් රබර් වත්ත ; අයිතිකරුගේ නම : මල්ලිකා ආරච්චිගේ ගුණවර්ධන, අරකාවිල, හඳපාන්ගොඩ ; ප්‍රමාණය : අ. 0, රූ. 3, ප. 20.7.

**මුළු එකතුව : අ. 0, රූ. 3, ප. 20.7**

ඉහත සඳහන් ඉඩමට භුක්ති විශෙෂයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 1965 සැප්තැම්බර් 20 වැනි දින පූ. භා. 11ට හොරණ ප්‍රා. ආ. නි. කායඝීලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1965.9.13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම භුක්ති විශෙෂයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

බී. සී. චන්ද්‍රදස,
ආණ්ඩුවේ උප ඒජන්ත තැන.

1965 අගෝස්තු 12 වැනි දින,
කළුතර කච්චේරිය.

8–629—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් ලබාගැනීමේ ආඥාපනත (460 පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

අංකය : ඉඅ/2/37.

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් භුක්ති විශෙෂය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල භුක්ති විශෙෂයේ විස්තර :—

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළයේ, උඩුගහ පත්තුවේ, ඉංගිරිය ගමේ පිහිටි, මූ.සැ.නො.ක 4 කැබලි අංක 1 සිට 2 දක්වා.

**කැබලි අංකය : 1.**

ඉඩමේ නම : පිබිලන්ඩ වත්ත ; ඉඩමේ විස්තර : අවු. 25-50 වයසැති පොල් ගස් 51, අවු. 2-3 පමණ වූ පොල් පැල 18, අවු. 2-5 වයසැති ගිණිකූරු ගස් 5, අවු. 25 වයසැති අඹ ගස් 1, අවු. 10 කෝපි පඳුරු 1 හා අවු. 2 වයසැති පුවක් ගස් 1කින් යුත් වත්ත ; අයිතිකරුගේ නම : ඊ. එම්. ඒ. ප්‍රනාන්දු, 46, උයන පාර, මොරටුව ; ප්‍රමාණය : අ. 0, රූ. 3, ප. 38.5.

**කැබලි අංකය : 2.**

ඉඩමේ නම : පිබිලන්ඩ වත්ත ; ඉඩමේ විස්තර : අවු. 2-3 වයසැති ගිණිකූරු ගස් 2ක් හා පේර ගස් 2, අවුරුදු 12 පමණ වූ රඹුටන් ගස් 1 හා අවුරුදු 5 කෝපි පඳුරකින් යුත් වත්ත ; අයිතිකරුගේ නම : ඊ. එම්. ඒ ප්‍රනාන්දු, 46, උයන පාර, මොරටුව ; දළුගොඩ කන්කානම්ගේ මල්ලිකා, ඉංගිරිය (ආරාවුල්කාරිය) ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 01.2.

**එකතුව : අ. 0, රූ. 3, ප. 39.7.**

ඉහත සඳහන් ඉඩම්වලට භුක්ති විශෙෂයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1965.9.20 වැනි දින පූ. භා. 10.30ට හොරණ ප්‍රා. ආ. නි. කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1965.9.13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් භුක්ති විශෙෂයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

බි. සී. චන්ද්‍රදාස,
ආණ්ඩුවේ උප ඒජන්තතැන.

1965 අගෝස්තු 7 වැනි දින,
කළුතර කච්චේරිය.

8–546—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය : ඇල්ඩී/ඩී—103.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත් කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

මහනුවර දිස්ත්‍රික්කයේ පාත දුම්බර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ උඩගම්පහ කෝරළේ මඩවල මඩිහේ ගමෙහි පිහිටි මූලික සැලසුම් අංක මහ 28හි කැබලි අංක 1 වශයෙන් මැන විස්තර කර ඇති, දැනට මහනුවර, ත්‍රිකුණාමල වීදියේ පදිංචි ඇම්. ඒ. ඇස්. මරික්කාර්, ශ්‍රෙෂ්ඨාධිකරන නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් මහතා සහ මඩවල මඩිහේ මඩවල බසාර් හි පදිංචි ඇස්. ඇම්. ඕ. මරික්කාර්, ඇස්. ඇම්. ඒ. ජබාර් මහතුන්, ඇස්. ඇම්. ජෙගුබාර් මහත්මිය, කේ. අබ්දුල් රෂීඩ් මහතා අයිතිවාසිකම් කියනු ලබන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 10.9 ක්වූ උඩුගන්නා වත්ත නමැති ඉඩම.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1965.10.15 වැනි දින පූ. භා. 11 ට මහනුවර කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1965.10.8 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. තවද, එම ඉඩම ගැන ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කර ගැනීම පිණිස සහ එම ඉඩම ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධව පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත් කළ යුතුය.

ඇස්. මාරලන්ද,
ආණ්ඩුවේ උපදිසාපති,
මහනුවර දිස්ත්‍රික්කය.

1965.8.13 වැනි දින,
මහනුවර කච්චේරිය.

8–646—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

**7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි**

මගේ අංකය: ඇල්ඩී/ඩී 116.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:—

මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත් හතර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, ගඟවට කෝරළේ, බෝවල ගමෙහි පිහිටි, මූලික සැලසුම් අංක මහ 16 හා කැබලි අංක 1 වශයෙන් මැන විස්තර කර ඇති දැනට මහනුවර, බෝවලවත්තේ පදිංචි පී. බී. එක්. ගොඩමුන්න නමැති අය විසින් අයිතිවාසිකම් කියනු ලබන, ප්‍රමාණයෙන් අක්කර 0, රූඩ් 2, පර්. 00 ක්වූ මවුන්ට් ප්ලසන්ට් වත්ත නැමැති ඉඩම.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1965.10.8 වැනි දින පූ. භා. 10.30 ට මහනුවර කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1965.10.1 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. තවද එම ඉඩම ගැන ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කර ගැනීම පිණිස සහ එම ඉඩම ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධව පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත් කළ යුතුයි.

ඇස්. මාරලන්ද,
ආණ්ඩුවේ උප දිසාපති,
මහනුවර දිස්ත්‍රික්කය

1965 අගෝස්තු මස 13 වැනි දින,
මහනුවර කච්චේරිය.

8–116—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශොධන) පනතින් සංශොධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 පරිච්ඡේදය)

**33 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි**

සඳහන් අංකය: 3/62/95 / ජේ. 57/58 ඇල්ජී 373

ලොකුබන්ඩා උදලාගම කුරුණෑගල දිස්ත්‍රික්කයේ උප ඒජන්ත වන මම, 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශොධන) පනතින් සංශොධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 පරිච්ඡේදය) 33 වෙනි වගන්තිය යටතේ මෙහි උපලේඛනයේ විස්තර කර ඇති ඉඩමේ වන්දි මුදල සහ පොලී මුදල වන රුපියල් හය සිය අසූහතරකුත්, ශත අසූ හතක් (රු. 684.87) ඊට හිමිකම් ඇති අයවළුන් විසින් ලබාගැනීම සඳහා කුරුණෑගල දිස්ත්‍රික් උසාවියේ නඩු අංක 691/ඇල්.ඒ. යටතේ තැන්පත් කරන්ට යෙදුන බව මෙයින් දැනුම් දෙමි.

ඇල්. බී. උදලාගම,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ
උප ඒජන්ත.

1965 අගෝස්තු මස 13 වෙනි දින,
කුරුණෑගල කච්චේරියේදී ය.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩ විල්ලි හත්පත්තුවේ, කුරුණෑගල නගර සීමාව තුල ඉලුප්පුගෙදර නමැති ගමේ පිහිටි, අංක 1,597 දරණ මූලික සැලැස්මේ මැන වඩා විස්තරව හැඳින්වෙන කැබලි අංක 1 දරණ අක්. 0, රූ. 0, පර්. 04.4ක විශාලත්වයක් ඇති කඳුබොඩගගමුලහේන, සුමංගල මාවතේ වරිපනම් අංක 1 න් කොටසක් නමැති ඉඩම.

8–707—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශොධන) පනතින් සංශොධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 පරිච්ඡේදය)

**7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි**

අංක: ඉ.අ./24.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

කරුණ—මඩ/ඔලුවිල් අක්කරෙයි රජයේ මුස්ලිම් මිශ්‍ර පාඨශාලාව සඳහා.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර:—

පහත සඳහන් ඉඩම්, නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ අක්කරපත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, ඔලුවිල් ගමේ පිහිටා ඇත.

මූලික සිතියම් අංක: ඒ. 1,463.

කැබෙල්ල: 1.

ඉඩමේ නම: අක්කරෙයි වෙම්පුපූමි; ඉඩමේ විස්තර: අවුරුදු 15ක් පමණ වයසැති කොහොඹ ගස් 2 කින්ද, මැටි ගසනලද බිත්තිවලින් හා පොල් අතු සෙවිලිකරන ලද තාවකාලික ගොඩනැගිල්ලක කොටස කින්ද යුක්තවූ ඉඩම; හිමිකම් කියන අය: ඔලුවිල්හි, අවක්කාර්පොඩි ඉස්මාලෙබ්බේ මහතා; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 15.2.

කැබෙල්ල: 2.

ඉඩමේ නම: අක්කරෙයි වෙම්පුපූමි; ඉඩමේ විස්තර: අවුරුදු 15ක් පමණ වයසැති කොහොඹ ගස් 2 කින්ද, මැටි ගසනලද බිත්තිවලින් හා පොල් අතු සෙවිලිකරන ලද තාවකාලික ගොඩනැගිල්ලක කොටස කින්ද යුක්තවූ ඉඩම; හිමිකම් කියන අය: ඔලුවිල්හි, කලන්දර් උදුමාලෙබ්බේ මහතා; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 08.1.

එකතුව: අ. 0, රූ. 0, ප. 23.3.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 1965 ඔක්තෝබර් මස 12 වන දින පෙරවරු 9.30 ට අක්කරපත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1965 ඔක්තෝබර් මස 5 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

තම තමන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය සියළු ඔප්පු තිරප්පු හා අනෙක් ලියවිලි පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුයි.

ආර්. ජී. ජී. ඕ. ගුණසේකර,
ආණ්ඩුවේ දිසාපති,
අම්පාර දිස්ත්‍රික්කය.

1965 අගෝස්තු මස 10 වැනි දින,
උහන කච්චේරිය.

8–660—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පණතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය : 3/62/193-ජේ 63/64 ඊ 121

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

**අංක 388 දරණ අ. ශ. සැ. 3 වෙනි අතිරේකය.**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත්පත්තුවේ පන්නල ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ නැගෙනහිර මැදපත්තු කෝරළේ හමන්ගල්ල නැමැති ගම.

**බිම් කට්ටි අංක : 80.**

ඉඩමේ නම : ඇහැටුගහමුලහේන ; විස්තරය : අවුරුදු 20-30 පොල්ගස් 16ක්, අවුරුදු 4-8 පොල්ගස් 22ක්, අවුරුදු 50ක ගොරක ගසක් සහ අවුරුදු 18ක කිතුල් ගසක් සහිත පොල් ඉඩම ; හිමිකම් කියන්නා : හමන්ගල්ලේ නාරන්ගොඩ පදිංචි ඇස්. ඩී. විමලාවතී මිය., ප්‍රමාණය : අ. 0, රූ. 3, ප. 21.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1965.10.6 වැනි දින පූ. භා. 10.30 ට කුරුණෑගල කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1965.9.29 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඇල්. බී. උඳලාගම,<br>
ආණ්ඩුවේ උප දිසාපති.<br>
කුරුණෑගල දිස්ත්‍රික්කය.

1965 අගෝස්තු මස 9 වැනි දින,<br>
කුරුණෑගල කච්චේරිය.

8–548—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය : 2/42/91.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

**පිහිටීම :** සබරගමුව පලාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, බෙලිගල් කෝරළේ, අම්පේ ගමේ.

සැලැස්මේ අංකය සහ බිම්කට්ටි අංකය : කෑ. 14 දරණ මූලික පිඹුරේ අංක 1 දරණ බිම් කට්ටිය.

ඉඩමේ නම : අම්පේ වත්ත ; විස්තරය : වත්ත, අවු. 60-70 දක්වා වයසැති පොල්ගස් 141 යි, අවු. 40-50 දක්වා වයසැති රබර් ගස් 69, අවු. 10-15 දක්වා වයසැති පුවක් ගස් 19, අවු. 10-15 දක්වා වයසැති දොඩම් ගස් 5 ක් සහ අවු. 8-10 දක්වා වයසැති කෝපි ගස් 16 ක් ද, නොබැඳු ළිඳක් ද ඇත ; හිමිකම් කියන්නා : මඩපාත, බට කැත්තර පදිංචි, ඇලෙක්සැන්ඩර් ජොරනියස් පීරිස් ; විශාලත්වය : අක්කර 1, රූඩ් 3, පර්චස් 38.0.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1965.9.28 වැනි දින පූ. භා. 10 ට කෑගල්ලේ කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1965 සැප්තැම්බර් මස 21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් 2ක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඩී. ඇම්. විට්ටාච්චි,<br>
ආණ්ඩුවේ උප දිසාපති,<br>
කෑගල්ල දිස්ත්‍රික්කය.

1965 අගෝස්තු මස 10 වැනි දින,<br>
කෑගල්ලේ කච්චේරිය.

8–551—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන ආඥපනත යටතේ දැන්වීම්

344/846

### දීමනා පත්‍ර ලැබීමට සුදුස්සන් තේරීම පිළිබඳ ඉඩම් කච්චේරියේ දැන්වීමයි

මෙහි පහත විස්තර දක්වෙන ආණ්ඩුවේ ඉඩම් සඳහා දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරාගනු පිණිස කුරුණෑගල දිසාපති කාර්‍යාලයේ දී 1965 සැප්තැම්බර් මස 20 වෙනි දින පූ.භා. 10. ට 1935 හේ අංක 19 දරන ඉඩම් සශ්‍රීක කිරීමේ ආඥපනත යටතේ ඉඩම් කච්චේරියක් කුරුණෑගල ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් පවත්වන බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. ඉඩම් කට්ටි ලබාගනු කැමති සැම අයකු විසින්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් පෙනීසිටීමට නියෝජිතයකු එවිය යුතුයි.

3. මේ ඉඩම් කච්චේරිය පිළිබඳව දැනගතයුතු යමක් ඇතහොත් එය ආණ්ඩුවේ ඒජන්තතුමාගෙන් විභාගකළ යුතුයි.

එච්. ද ඇස්. ශේවාවිසෙන්ති,<br>
ඉඩම් කොමසාරිස්තැන වෙනුවට.

**දීමට යන ඉඩමේ විස්තර**

ප්ලෑනේ අංකය : අ.ග.සි. 1,629; ගම : වලස්වැව

| කැබෙල්ලේ අංකය | | අවසර පත්‍ර දරන්නාගේ හෝ ඉල්ලුම්කරුගේ නම | | ප්‍රමාණය අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 121 | ... | ඇෆ්. ඇන්. ඩී. සිල්වා | ... | 7 | 1 | 22 |
| 128 | ... | එම | ... | 5 | 3 | 1[illegible] |
| 113 | ... | එම් සමරක්කොඩි | ... | 14 | 1 | 15 |
| 114 | ... | එච්. කේ. සුගතපාල | ... | 14 | 0 | 38 |
| 116 | ... | ජේ. ඒ. ඩී. වයි. ජයකොඩි | ... | 4 | 2 | 23 |
| 120 | ... | එම | ... | 9 | 2 | 13 |
| 125 | ... | අයි. ආර්. රංබණ්ඩා | ... | 1 | 3 | 28 |

8–540—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

## මාතර දිස්ත්‍රික්කයේ වල්ගම, මාතර නව ආරෝග්‍යශාලාව සඳහා රජයට අත්කර ගැනීමට යෙදුණු ඉඩමේ ස්ථිර වගාවේ පළදාව ගැනීමේ අයිතිය බදු දීම

පහත දැක්වෙන උපලේඛනයේ විස්තර වන ඉඩමේ ඇති ස්ථිර වගාවේ පළදාව ලබා ගැනීමේ අයිතිය පහත දැක්වෙන කොන්දේසි වලට යටත්ව 1965 අගෝස්තු මස 30 වැනි දින සිට 1966 අගෝස්තු මස 30 වැනි දින දක්වා කාලය තුළ බදු දීම සඳහා (මෙහි මින්මතු දිසාපතියැයි සඳහන් කෙරෙන) මාතර දිස්ත්‍රික්කයේ දිසාපති විසින් ටෙන්ඩර් භාරගන්නා බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### කොන්දේසි

1. ටෙන්ඩර් කැඳවනු ලබන්නේ වාර්ෂික බදු මිළ සඳහාය. වාර්ෂික බද්ද සඳහා තබන ලද ලන්සුව රුපියල් 600.00 කි. ඊට අඩුවෙන් ඇති ටෙන්ඩර් භාරගනු නො ලැබේ.

2. මාතර කච්චේරියෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල ලියා ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත්‍රයක් ඉල්ලුම් කර සිටින්නකු පළමු කොට මාතර කච්චේරියේ රුපියල් 10 තැන්පත් කොට එහි කුවිතාන්සිය ඉදිරිපත් කර සිටිතොත් විනා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු නො ලැබේ. ඉල්ලුම්කරු ටෙන්ඩරය ඉදිරිපත් කර ඇත්තේ ව්‍යාජ අදහසින් යැයි හෝ ඉල්ලුම්කරු නිසා ආණ්ඩුවට අනවශ්‍ය වියදම් නොහොත් අපහසුකම් සිදුවිනැයි හෝ ආණ්ඩුවේ දිසාපති විසින් සලකනු ලබතොත් විනා මෙකී තැන්පත් මුදල ඉල්ලුම්කරුට ආපසු ගෙවනු ඇත. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1965 අගෝස්තු මස 23 වැනි දින උදේ 10 දක්වා නිකුත් කරනු ලැබේ. වෙන කිසිදු ෆෝර්මයක ලියා එවන ටෙන්ඩර් ආකෘති පත්‍ර සැළකිල්ලට ගනු නො ලැබේ.

3. "මාතර නව ආරෝග්‍යශාලාව සඳහා යෝජිත ඉඩමේ පළදාවෙහි බදු දීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් කවරයේ පිටින් ලියා සීල් තබා ඉදිරිපත් කරන ටෙන්ඩර 1965 අගෝස්තු මස 30 වැනිදා දාවල් 11 දක්වා මාතර කච්චේරියේදී භාරගනු ලැබේ. ඉල්ලුම්කරුවන් ඔවුන්ගේ, ටෙන්ඩර් ආකෘති පත්‍ර මාතර කච්චේරියේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතු ය. එසේත් නොවේ නම් "දිසාපති , මාතර කච්චේරිය, මාතර" යනුවෙන් සඳහන් කර ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතු ය. ටෙන්ඩර් ආකෘති පත්‍ර මාතර කච්චේරියේදී 1965 අගෝස්තු මස 30 වැනි දින දාවල් 11 වන විට විවෘත කරනු ලබන හෙයින් සියළුම ටෙන්ඩර්කරුවන්ට එ දින ඒ වේලාවට තමන්ම පැමිණ සිට හෝ තමන් වෙනුවෙන් යථා පරිදි පිළිගත් නියෝජිතයෙකු එවා හෝ තමන් සැබෑ අදහසින් ම ටෙන්ඩර් ඉදිරිපත් කර ඇති බවට දිසාපති සෑහීමකට පත් කළ යුතු සි.

4. පිළිගත් ටෙන්ඩරය ඉදිරිපත් කළ ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරය පිළිගනු ලැබූ වහාම ඔහු විසින් ටෙන්ඩර කරන ලද මුදල සම්පූර්ණ වශයෙන් දිසාපතිට ගෙවිය යුතු සි. ඉහත දැක්වූ පරිදි ටෙන්ඩර්කරු විසින් මුදල් ගෙවීමට අපොහොසත් වුවහොත් මෙම් අයිතිය විකිණීම අවලංගු කිරීමටත්, එම ටෙන්ඩර්කරු විසින් ගෙවා ඇති යම් මුදලක් වෙතොත් එය රාජසන්තක කිරීමටත් දිසාපතිට පිළිවන.

5. දිසාපති තුමාට අවශ්‍ය යැ සි හැඟී නියම කළහොත් පිළිගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් ඇප මුදලක් තැන්පත් කළ යුතු ය. මේ මුදල කෙසේවත්, ඉල්ලුම් කරන ලද මුදලෙන් සියයට 10 කට වැඩි නො විය යුතු සි.

6. ඉල්ලුම් කරන ලද මුළු මුදල ගෙවීමෙන් සහ 5 වැනි ඡේදයේ සඳහන් මුදල තැන්පත් කිරීමෙන් ඉක්බිති වෙනත් කොන්දේසි සමග පහත සඳහන් කොන්දේසිද පිළිගත් ටෙන්ඩර්කරුට අයිතිය හිමිවනු ඇත :—

(1) ඕනෑම අවස්ථාවක මාසයක් කල් දෙමින් ලියවිල්ලක් බලපත්‍රකරුට පුද්ගලිකව භාර දීමෙන් හෝ ඔහුගේ හෝ ඇගේ හෝ අවසන් වරට දන්වන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යැවීමෙන් හෝ බදු දෙන ලද ඉඩමෙහි පැහැදිළිව පෙනෙන ස්ථානයක අලවා තැබීමෙන් හෝ මේ බද්ද එසේ කල් දෙනු ලැබූ මස අවසන අවලංගු කළ හැකි ය.

(2) ඉඩම වෙනුවෙන් ගෙවිය යුතු බදු, අයබදු, වරිපනම් ආදී සියළුම වැය මුදල් බදුකරු විසින් ගෙවිය යුතු ය.

(3) බලපත්‍රකරු තමාගේම වියදමින් ඉඩමේ සියළුම ආණ්ඩුවේ මායිම් ලකුණුද මායිම්ද යොදා ඒවා මනා තත්ත්වයෙන් තබා ගත යුතු යි.

(4) බලපත්‍රකරු ආණ්ඩුවේ දිසාපතිගෙන් ලියවිල්ලකින් කලින් අවසර ලබා නො ගෙන ඉඩමේ ඇති ගස් කොළන් කැපීම, ඉවත් කිරීම හෝ කවර ආකාරයකින් වුවද, ඒවාට අලාභ හානි කිරීම හෝ නො කළ යුතු සි.

(5) බලපත්‍රකරු ආණ්ඩුවේ දිසාපතිගෙන් ලියවිල්ලක් මගින් කලින් අවසර ලබා ගෙන විනා ඉඩමෙන් වැලි හෝ බොරළු ඉවත් කරගෙන නොයා යුතුයි.

(6) බලපත්‍රකරු ආණ්ඩුවේ දිසාපතිගෙන් ලියවිල්ලක් මගින් කලින් අනුමතිය ලබා නො ගෙන කිසිම තාවකාලික හෝ ස්ථිර හෝ ගොඩනැගිලි ආදියක් ඉඩමෙහි නො තැනිය යුතු ය.

(7) බලපත්‍රකරු ඉඩම් කොමසාරිස්ගෙන් ලියවිල්ලක් මගින් කලින් අනුමතිය ලබා නො ගෙන බද්ද සම්බන්ධයෙන් තමාට ඇති අයිතිවාසිකම් වෙන කෙනෙකුට පැවරීම හෝ අතුරු බදු දීම හෝ උකස් කිරීම හෝ වෙනත් අයුරකින් අත් මිදීමක් හෝ නො කළ යුතු සි.

(8) ඉඩමේ පළදාව රැක බලාගැනීමට ද, හොරුන්ගෙන්, ගින්නෙන්, හෝ වෙනත් අයුරකින් සිදුවන අලාභ හානි වළක්වා ලීමටද අවශ්‍ය විධිවිධාන බලපත්‍රකරු විසින්ම යෙදිය යුතු සි. තවද මේ වෙනුවෙන් රජයෙන් යම් වන්දියක් ඉල්ලා සිටීමට ඔහුට අයිතිවාසිකමක් නො ලැබේ.

(9) බලපත්‍රකරු විසින් ගෙඩි කැඩීම, වගා කිරීම, ඉඩම මනා තත්ත්වයෙන් පවත්වාගෙන යාම, වල් පැළෑටි නෙලීම හා අළුතෙන් පැළ සිටුවීම යන මේවා මනා කෘෂිකාර්මික ක්‍රමයක් අනුවත්, රජයේ දිසාපති සෑහීමට පත්වන පරිදිත් කළ යුතු ය.

(10) කවර විටකදී හෝ ඉඩමට ඇතුළුවීමට ද එය පරීක්ෂා කිරීමට ද ආණ්ඩුවේ දිසාපතිට හෝ ඔහු විසින් යථා පරිදි බලය පවරනු ලැබූ නිලධාරියෙකුට බලපත්‍රකරු විසින් ඉඩ දිය යුතු සි.

(11) බද්ද අවසන් වන්නට කලින් මෙම මුළු ඉඩම හෝ ඉන් කොටසක් හෝ ආණ්ඩුවට අවශ්‍ය වී නම් ලියවිල්ලකින් මාසයක් කල් තියා දැනුම් දුන් විට බලපත්‍රකරු විසින් මුළු ඉඩම හෝ එම කොටස ආණ්ඩුවේ ඒජන්තට ආපසු භාර දිය යුතුයි. එසේ වූ විට තමා විසින් දැනටමත් ගෙවා ඇති බදු කුලියෙන් සමානුපාතික කොටසක් ආපසු ලබාගැනීමට ද බද්දෙන් ඉකුත් නොවූ කාල සීමාව වෙනුවෙන් තමා විසින් ගෙවිය යුතු බදු කුලිය සමානුපාතිකව අඩු කරවා ගැනීමට හිමිකමක් බලපත්‍රකරුට ඇත්තේ ය.

(12) බලපත්‍රකරු විසින් බද්දේ කොන්දේසි වලින් යමක් කඩ කළහොත් කිසිදු වන්දියක් නො ගෙවා ඉඩමේ භුක්තිය ආපසු ගැනීමටත් බලපත්‍රකරුගේ තැන්පත් මුදල සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් හෝ රාජසන්තක කිරීමටත් ආණ්ඩුවේ දිසාපතිට බලය ඇත්තේ ය.

(13) වැඩිදියුණු කිරීම් වෙනුවෙන් හෝ වෙනත් කිසිම කරුණක් වෙනුවෙන් හෝ ආණ්ඩුවෙන් වන්දියක් ලැබීමේ කිසිම හිමිකමක් බලපත්‍රකරුට නො ලැබෙන්නේ ය.

(14) බදු කාලය තුළ එය ආපසු පැවරීමට ඉඩ දෙනු නො ලැබේ.

7. යම් ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ආණ්ඩුව වෙත තබා ගනු ලැබේ.

8. මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපතිගෙන් ඉල්ලුම් කර සිටීමෙන් බද්ද හා ටෙන්ඩර් කොන්දේසි පිළිබඳ වැඩිදුර විස්තර ලබාගත හැකි ය.

ප්‍රා. සී. පීටර්ස්,
මාතර දිසාපති.

1965 අගෝස්තු මස 12 වන දා,
මාතර දිසාපති කාර්යාලයේ දී ය.

### උපලේඛනය

මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුවේ සහ කඩවත් සතරේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ වල්ගම පිහිටි අක්කර 29යි, රූඩ් 2, පර්. 0 පමණ වූ බිම් ප්‍රමාණයක් ඇති "කහම්පල කුරුඳුවත්ත හෙවත් නාරෝදේ කුරුඳුවත්ත" නමැති රජය සතු ඉඩම සහ ඊට මායිම් :—

උතුරට : ගම්සභා පාර ; නැගෙනහිරට : සරප්පුගෙවත්ත නමැති ඉඩම ; දකුණට . දෙවුන්දර ලියනගෙ මෙන්ඩිස් සිල්වා සහ තවත් අය අයිතිකම් කියන නාරෝදේ කුරුඳුවත්ත නමැති ඉඩම, ඩී. එල්. එම්. සිල්වා සහ තවත් අය හිමිකම් කියන ගොරකගහවත්ත නමැති ඉඩම සහ වෙලේගොඩ වල්ගම රජයේ වැඩ දෙපාර්තමේන්තුවට අයත් පාර ; බටහිරට : පන්සලේ හෝ පින්දෙනිය කැලේ හෝ වෙන ඇති පාර හෝ එම මාවත.

8–444—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට වැටෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට පිහිටි දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම යැවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ වැලව්වේනගෙයහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි